// ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,149 — 1960 ජුනි 24 වැනි සිකුරාද — 24.6.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඞ කරන ලදි)

# IV වැනි කොටස – පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි, සෑම කොටසකටම අයක් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)



| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... | 121 | ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශ ... | — |
| තනතුරු—ඇබෑර්තු ... ... | 124 | අය-වැය ලේඛන ... ... | 128 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 126 | දේපල විකිණීම ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | 126 | මාගී කොමිටි දැන්වීම් ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් | — | විවිධ දැන්වීම් ... ... | 128 |



## පළාත් පාලන නිවේදන

ඇල්.ජී.ඞී—ජීසී. 48/49.

### 1946 යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනත

1946යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ කරුවලගස්වැව ගම්ප්‍රදේශයේ ගම්කාය්‍යී සභාව විසින් සම්මත කරගන්නා ලද පහත දැක්වෙන යෝජනාව පළාත් පාලන සහ නිවාස පිළිබඳ ගරු ඇමති තුමා විසින් අනුමත කරන ලදුව, එකී වගන්තියේ (2) වැනි උප වගන්තියේ ප්‍රකාර එය මෙහි පළකරනු ලැබේ :—

**යෝජනාව**

1946යේ අංක 12 දරණ විනෝද බද්ද පිළිබඳ ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙම කාය්‍යී සභාව විසින් මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වූ දින සිට මෙම කාර්ය සභාවේ පාලන බල සීමාව ඇතුළත පැවැත්වෙන (ආඥාපනතේ විස්තර කර තිබෙන) විනෝද සඳහා ප්‍රවේශවීම පිණිස අයකරණු ලබන ගෙවීම් වලින් පහත දැක්වෙන රේට් ගණන් අනුව බද්දක් මෙයින් පණවා අයකරනු ලැබේ :—

| ගෙවන මුදල | බද්දේ රේට් ගණන රු. ශ. |
|---|---|
| බද්ද හැර ඇතුළත්වීමේ ගාස්තුව :— | |
| (අ) ශත 20කට අඩු නොවන්නාවූ එහෙත් ශත 50කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 5 |
| (ආ) ශත 50කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 1කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 10 |
| (ඇ) රුපියල් 1කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 1.50 කට වැඩි නොවන්නාවූ විට ... | 0 15 |
| (ඈ) රුපියල් 1.50කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 2කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 20 |
| (ඉ) රුපියල් 2කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 3කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 30 |
| (ඊ) රුපියල් 3කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 4කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 40 |
| (උ) රුපියල් 4කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 5කට වැඩි නොවන්නාවූ විට ... ... | 0 50 |
| (ඌ) රුපියල් 5කට වැඩි වන්නාවූ එහෙත් රුපියල් 10කට වැඩි නොවන්නාවූ විට ... ... | 1 00 |
| (එ) රුපියල් 10කට වැඩිවූ විට :— | |
| (i) පළමුවැනි රුපියල් 10ට ... ... | 1 00 |
| (ii) ඊට වැඩිවූ එක් එක් රුපියල් 5ට හෝ ඉන් කොටසකට ... ... | 1 00 |

වී. සී. ජයසූරිය,
පළාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් තුමා.

1960 ජුනි මස 9 වැනි දින,
කොළඹදීය.

## වාද්දුව සඳහා පළාත් ආණ්ඩු සභාවක් සංස්ථාපනය කිරීම

කළුතර දිස්ත්‍රික්කයේ වාද්දුව සුළු නගර සභාව මගින් දැනට පාලනය කරගෙන යනු ලබන ප්‍රදේශයද, අංක 9 දරණ අළුත් ඡන්ද දායක කොට්ඨාශයක් සකස්වන සේ, අංක 5 සහ 6 දරණ ඡන්ද දායක කොට්ඨාශයේ දකුණු දෙසට පිරිවෙණ පාර දක්වා හා මහ විහාර පාරේ මැදසිට නැගෙනහිර දෙසට දම්වැල් 8ක් දක්වා අංක 8 දරණ ඡන්දදායක කොට්ඨාශයෙන් නැගෙනහිරට අයිතිවන අමතර ප්‍රදේශයක්ද ඇතුළත් වන පරිදි 1939යේ අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥපනතේ ප්‍රකාර, පළාත් ආණ්ඩු සභාවක් සංස්ථාපනය කිරීමට යෝජනා කර තිබේ.

2. මෙම යෝජිත පාලත් ආණ්ඩු සභාව, සංස්ථාපනය කිරීම, මායිම් කිරීම හා ඡන්දදායක කොට්ඨාශ බෙදීම යන මේ කාරණා පිළිබඳව ඉක්මණින් අවසාන තීරණයකට එළඹීම සඳහා ඒ ගැන සැළකිල්ලක් දක්වන අයගේ හෝ සමිති සමාගම්වල හෝ අදහස් උදහස් විමසා සිටින ලෙස පළාත්පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් මට නියමකර තිබේ.

3. එමනිසා, මේ පිළිබඳව ඉදිරිපත් කරණ කරුණු, මෙම දැන්වීම පළ කරණු ලැබීමෙන් මසක් ඇතුළත දී පහත සඳහන් ලිපිනය වෙත ලියවිල්ලකින් ඉදිරිපත් කර සිටිය යුතුය :—

ලිපිනය :

පළාත් පාලන කොමසාරිස්,
තැපැල් පෙට්ටිය 500,
කොළඹ.

වී. සී. ජයසූරිය,
වැඩබලන පළාත් පාලන කොමසාරිස්.

1960 ජූනි මස 18 දින,
කොළඹ, පළාත් පාලන කාර්යාලයේ දී.

---

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥපනතේ 3 වන වගන්තියේ '' 1 '' වන උප වගන්තිය යටතේ තලාපිටගම්පත්තුව ගම්කායසභාව විසින් 1957 නොවැම්බර මස 15 වෙනි දින අංක 11,196 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරණලද යෝජනාවෙන් සම්මතකර ගත්නාලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වෙනි කාණ්ඩයේ '' 1 '' වෙනි අතුරු ව්‍යවස්ථා ප්‍රකාර මෙහි පහත සඳහන්කර ඇති පාරවල් සහ අඩිපාරවල්වල ඉදිරියෙන් සඳහන්කර ඇති නියම දිග පළල අනුව එකී පාරවල් සෑදීම හා ප්‍රතිසංස්කරණය කිරීම මෙම ගම්කායසභාව විසින් කරණු ලැබේ :—

| චන්ද කොට්ඨාශයේ නම සහ අංකය | | පාරේ සහ අඩිපාරේ නම | දිග හැ. | දිග ද. | පළල අඩි |
|---|---|---|---|---|---|
| 1. කිංචිගුණේ | 1. | මුංගස්තැන්න–කිංචිගුණේපාර | 0 | 60 | 12 |
| | 2. | අම්බලන්තැන්න–නැදුන්ගමුව පාර | 1 | 00 | 18 |
| | 3. | මුංගස්තැන්න–වෙරළුගස්මංකඩපාර | 1 | 40 | 12 |
| | 4. | මහතැන්න–කිංචිගුණේ පාර | 3 | 00 | 18 |
| | 5. | අඟුරුකොටුව–කලවැල්පේපාර | 0 | 20 | 12 |
| 2. නැදුන්ගමුව | 6. | කුඹල්ගම–කිල්ලකඳුර පාර | 1 | 40 | 12 |
| | 7. | නැදුන්ගමුව–දඩුමංකඩපාර | 3 | 00 | 12 |
| | 8. | නැදුන්ගමුව–උඩමංකඩපාර | 2 | 00 | 12 |
| 3. පුවක්ගහවෙල | 9. | මහතැන්න–කිංචිගුණේ පාර | 0 | 40 | 18 |
| | 10 | පී. ඩබ්ලිව්. ඩී. පාර–පඹහින්න | 0 | 40 | 12 |
| 4. බිබිල | 11. | මහතැන්න–ඇට්ලන්ටා වත්ත පාර | 1 | 00 | 12 |
| | 12. | පී. ඩබ්ලිව්. ඩී. පාර–ඔලිතැන්න | 1 | 00 | 12 |
| | 13. | බිබිල–දෙමෝදර පාර | 2 | 40 | 12 |
| | 14. | ඇට්ලන්ටාවත්ත–බිබිල පාර | 0 | 40 | 12 |
| 5. මුත්තෙට්ටුවේගම | 15. | මුත්තෙට්ටුවේ ගම–බුදුන්වෙල පාර | 3 | 00 | 18 |
| | 16. | හිරළුවාවෙල–පුවක්ගහවෙල පාර | 0 | 60 | 18 |
| | 17. | මුත්තෙට්ටුවේගම–දෙයියන්නේ අමුනපාර | 0 | 40 | 12 |
| | 18. | මහතැන්නෙ–මංකඩ අරාව | 0 | 40 | 12 |
| | 19. | බක්වෙල–කනුමුල්කැටිය පාර | 0 | 60 | 12 |
| 6. හල්පේ | 20. | මොරගහමඩිත්ත–වේරගොඩ පාර | 1 | 40 | 12 |
| | 21. | වැලිබිස්ස–හටන්ගල පාර | 1 | 40 | 12 |
| | 22. | තුඹතැන්න–බුදුන්වෙල පාර | 1 | 00 | 12 |
| | 23. | බුදුන්වෙල–වේරගොඩ පාර | 3 | 00 | 12 |
| | 24. | හල්පේ–මියනවල පාර | 2 | 00 | 12 |
| | 25. | නේල්ලිවලමංකඩ පාර | 1 | 00 | 12 |
| 7. යක්කුඹුර | 26. | ඉලපත්තැන්න–කහටගස්කපල්ල පාර | 1 | 00 | 12 |
| | 27. | වේරගොඩ–නිත්තමළුව පාර | 3 | 00 | 18 |
| | 28. | ගුරුකඳුර–මහඹය පාර | 3 | 00 | 12 |
| | 29. | දවටගස්කපල්ල–වදවල පාර | 2 | 40 | 12 |
| 8. ඉහලගලගම | 30. | ගල්පොතුතැන්න–කලවැල්මංකඩ පාර | 1 | 00 | 18 |
| | 31. | කලවැල්මංකඩ–තිනිඹය පාර | 3 | 40 | 18 |
| | 32. | ගල්පොතුතැන්න මහ ඒදණ්ඩ ලඟ සිට දියබෙත්මේ පංසල දක්වා පාර | 1 | 40 | 12 |
| | 33. | ඉහලගලගම–පුපුලගල පාර | 1 | 40 | 12 |
| 9. පුස්වැලගොල්ල | 34. | නාවල සිට ගොරොක්ගස දක්වා පාර | 1 | 40 | 12 |
| 10. කුඹුරුතැනිවෙල... | 35. | අමුණුමුල්ල–මහළුලි පාර | 0 | 20 | 12 |
| | 36. | ගල්ඒදණ්ඩ ලඟ සිට මහ ඒදණ්ඩතෙක්පාර | 0 | 20 | 12 |
| | 37. | කුඹුරුතැනිවෙල සිට ඇට්ලන්ටා වත්තතෙක් පාර | 0 | 40 | 12 |
| 11. උඩමද්දෙපිටවෙල | 38. | මරංගොඩ–ගලගම පාර | 1 | 40 | 12 |
| 12. ගලගම | 39. | ගලගම–බිබිල පාර | 0 | 60 | 12 |
| | 40. | පී. ඩබ්ලිව්. ඩී. පාර–මහළුලිපාර | 0 | 20 | 12 |

ගම්සභාකයසීලය,
තලාපිටගම්පත්තුව,
බෙලිහුල්ඔය, 1960.5.27

ජී. ඩී. බී. පුන්චිමහත්මයා,
ගම්සභාපතිතැන.

## ගම්සභා ආඥපනත—198 වැනි පරිච්ඡේදය

### අටකලන්කෝරළයේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්කායර් සභාව

රත්නපුර දිස්ත්‍රික්කයේ අටකලංකෝරලයේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්කායර් සභාව විසින් පහත සඳහන් යෝජනාව සම්මත කරගත් බව මහජනයා වෙත මෙයින් දනුම්දෙනු ලැබේ.

මෙයට,
ආතර් ඇස්. විජේරත්න,
ගම්සභාපතිතැන.

ගම්සභා කයර්ාලය,
අටකළන්පන්න,
1960.6.14 වැනිදින

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි සභා පොදු අතුරු ව්‍යවස්ථා ආඥ පනතේ 3 වන වගන්තියේ " 1 " උප වගන්තිය යටතේ අටකළන්කෝරළයේ මැදපත්තු ගම් ප්‍රදේශයේ ගම්කායර් සභා විසින් 1953ක්වූ දෙසැම්බර් මස 23 වෙනිදින අංක 10,625 දරණ ගැසට් පත්‍රයේ හතරවැනි කාණ්ඩයේ ප්‍රසිද්ධ කරන ලද යෝජනාවෙන් සම්මතකර ගන්නා ලද පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා 4 වැනි කාණ්ඩයේ " 1 " වැනි අතුරු ව්‍යවස්ථා ප්‍රකාර මෙහි පහත සඳහන් මම්මාවත් එකිනෙක ඉදිරියෙන් සඳහන් දිග හා පළල අනුව සද හෝ නැවත සද පවත්වාගෙන යනු ලබන බව මෙයින් යෝජනාකරනු ලැබේ.

| අංකය | කොට්ඨාශයේ නම | පාරේනම | දිග දම්වැල් | පළල අඩි |
|---|---|---|---|---|
| 1. | රක්වාන | වෙරළුගහමුල-ගන්ගොඩ | 119 | 12 |
| 2. | එම | ඇලටන්වත්ත සිට කබරගල | 52 | 12 |
| 3. | එම | ගන්ගොඩ සිට කන්දවත්ත | 72 | 12 |
| 4. | වෙරළුගහමුල | වෙරළුගහමුල සිට ලියන්ගොඩ | 17 | 12 |
| 5. | එම | වෙරළුගහමුල සිට හොරමුලවත්ත | 18 | 12 |
| 6. | හපුරුදෙනිය | ආගරේගම සිට ඕපාත | 88 | 12 |
| 7. | එම | කහවත්තේ සිට වරාපිටිය හරහා කට්ටන්ගේ | 60 | 12 |
| 8. | එම | කොටකෙතන සිට කොටකෙතන ගම්මායිම | 67 | 12 |
| 9. | එම | හපුරුදෙනියසිට දිඹුල්වල | 214 | 12 |
| 10. | එම | හපුරුදෙනිය සිට පනාවල | 190 | 12 |
| 11. | දිඹුල්වල | දිඹුල්වල සිට දොඩම්පිටිය | 160 | 12 |
| 12. | එම | කට්ටන්ගේ පල්ලේගම සිට දිඹුල්වලතෙක් | 43 | 12 |
| 13. | රිදීවිට | රිදීවිට සිට ගොඩකවෙල | 147 | 12 |
| 14. | එම | ඇම්ටියගොඩ සිට අල්පිටිය | 162 | 12 |
| 15. | එම | රිදීවිට සිට වැලිකුඹුර | 160 | 12 |
| 16. | ඇම්ටියගොඩ | මාකඳුර සිට ඕපාතවත්ත | 80 | 12 |
| 17. | එම | ඇම්ටියගොඩ සිට මාකඳුර | 301 | 12 |
| 18. | එම | ඇම්ටියගොඩ පාරේ සිට නියන්ගම වැලිකන්ඩිය හරස්පාර | 180 | 12 |
| 19. | එම | මාකඳුර සිට කවුඩන්ගල්ල | 129 | 12 |
| 20. | එම | ඇම්ටියගොඩ සිට මාකඳුර අළුත්පාර | 132 | 12 |
| 21. | එම | මාකඳුර සිට නරිස්ස | 51 | 12 |
| 22. | පනාවල | මාදම්පේ සිට මාකඳුර | 274 | 12 |
| 23. | එම | බුළුවාන සිට පනාවල | 34 | 12 |
| 24. | එම | හිරමඩගම කැම්මන සිට බුළුවාන | 64 | 12 |
| 25. | එම | හිරමඩගම සිට පනාවල | 108 | 12 |
| 26. | එම | පනාවල සිට ඕපාතවත්ත | 66 | 12 |
| 27. | මාරගල | මාරගල් සිට තියඹරාවත්ත | 61 | 12 |
| 28. | එම | අල්පිටිය සිට දෙමෝදර | 53 | 12 |
| 29. | එම | අල්පිටියේ කෝන්ගහවත්ත සිට රිදීවිට | 66 | 12 |
| 30. | අල්පිටිය | ගලහිටියේ සිට ගලහිටිකන්ද | 67 | 12 |
| 31. | එම | ගලහිටියේ සිට යක්දෙහිකන්ද | 76 | 12 |
| 32. | එම | ගලහිටියේ සිට කරන්කැටිය | 225 | 12 |
| 33. | එම | ගලහිටිය 79වන කණුවේ සිට පල්ලෙකන්ද | 60 | 12 |
| 34. | කෝම්පිටිය | කෝම්පිටියේ සිට වැලිපොතකඩේ දක්වා | 68 | 12 |
| 35. | එම | නාරම්දෙනිය තොටුපොලේ සිට නාරම්දෙනිය ගොඩ හරහා පාර | 86 | 12 |
| 36. | බඹරගස්තැන්න | බඹරගස්තැන්න පාර | 103 | 12 |
| 37. | එම | වැල්කෙනියා පහළ ගොඩ සිට උඩහගොඩ | 69 | 12 |
| 38. | නියන්ගම | නියන්ගම සිට වැල්කෙනියාය | 120 | 12 |
| 39. | එම | නියන්ගම සිට එලමල්පේ | 95 | 12 |
| 40 | එම | පල්ලේගම සිට නියන්ගම | 60 | 12 |
| 41. | පල්ලේගම | වරායාය සිට බලවින්න | 65 | 12 |
| 42. | එම | වරායාය සිට අරඹෙදෙනිය | 20 | 12 |
| 43. | මස්ඉඹුල | අලවත්තැන්නේ සිට කැන්දපොල | 80 | 12 |
| 44. | මැද්දේගම | මැද්දේගම සිට යහලවෙල/රක්වාන | 102 | 12 |
| 45. | එම | ගොඩකවෙල සිට මැද්දේගම | 45 | 12 |
| 46. | ගොඩකවෙල | ගොඩකවෙල සිට වෙත්තිලකන්ද | 10 | 12 |
| 47. | වේරහැර | වේර හැර සිට නියන්ගම | 75 | 12 |
| 48. | එම | බෝගොඩවිහාරය දක්වා ඇති පාර | 40 | 12 |
| 49. | එම | කෝම්පිටිය සිට වේරහැර | 65 | 12 |
| 50. | කවුඩුවාව | කවුඩුවාව සිට තියඹරාවත්ත | 91 | 12 |
| 51. | හොරමුල | මාදම්පේ සිට හොරමුල පාර | 25 | 12 |
| 52. | මාදම්පේ | මාදම්පේ සිට පින්නගල | 25 | 12 |
| 53. | එම | මාදම්පේ සිට කලල්ඇල්ල | 38 | 12 |
| 54. | එම | මාදම්පේ සිට අල්පිටිය/ඇත්තලවත්ත | 81 | 12 |
| 55. | එම | මාදම්පේ සිට හොරමුල | 98 | 12 |
| 56. | එම | මාදම්පේ වත්ත සිට අල්පිටිය | 26 | 12 |

# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, 1946 අංක 5 දරන පළාත් පාලන සේවා (සංක්‍රමණ විධිවිධාන) ආඥපනතින් සංශෝධනය කරන ලද 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ විධිවිධාන වලට ද 1945 අංක 43 දරන ආඥපනත පිළිබඳව තවදුරටත් කෙරෙන සංශෝධන වලට ද ඒ ආඥපනත යටතේ සාදනු ලබන රෙගුලාසිවලට ද එසේ ම කොමිෂන් සභාව විසින් කලින් කල නියම කරනු ලබන අතිකුත් සේවා කොන්දේසි වලට ද යටත් වන්නේ ය.

3. **සේවයට බාරගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරු ද ස්ත්‍රීන් නො වන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලනු ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා වල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරු කර හරිනු ලැබුවහොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරන සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේ දී සේවයෙන් විශ්‍රාම ගැනීමේ දී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ, 1949 අංක 8 දරන පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1945 අංක 43 දරන පළාත් පාලන සේවා ආඥපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින් ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශික බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන් ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින් ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරන ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට සවකීය වැටුපෙන් සියයට 4ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුදලින් හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකි ය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනට ම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට, දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම දෙවර්ෂයක ආධුනික කාලයකට හෝ දෙවර්ෂයකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් විසින් සවකීය වයස තහවුරු කිරීම පිණිස උප්පැන්න සහතික පිටපත් අමුණා එවිය යුතුයි. දිවුරුම් පෙත්සම් නො පිළිගනු ලැබේ. උප්පැන්න සහතික පිටපත් අමුණා නැති කල්හි අයදුම්කරුවෝ සුදුසුකම් නැත්තවුන් ලෙස සලකනු ලැබෙති.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැතිනම්, අවුරුදු 2ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත්, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානයන් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් මෙතෙක් සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝගවලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ට" නියම කරනු ලැබෙයි.

(iii) (අ) සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) ඔවුන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය අවසානයේදී තනතුරුවල ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර සිංහල ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත්වීම උඩ රඳා පවතී.

සවකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළතදී සිංහල භාෂා ප්‍රවීණත්වයෙහි ලා නියමිත තත්ත්වයට පැමිණීමට නොහැකි වන නිලධාරීන්ගේ සේවය නැවැත්විය හැකිය. එහෙත්, රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලැබීම සඳහා අවංක ප්‍රයත්නයක් දරා ඇති බවට පළාත් පාලන සේවා කොමිෂන් සභාවට සෑහීමකට පත් විය හැකි නම් එසේ සේවය නතර කිරීම කල් දැමිය හැකිය. නියමිත දිනයෙන් පසු සාධාරණ කාල පරිච්ඡේදයක් ඇතුළතදී නිලධාරියා පරීක්ෂණයෙන් සමත් වුවහොත්, කොමිෂන් සභාවේ අභිමතය පරිදි, ජ්‍යෙෂ්ඨතාව සම්බන්ධයෙන් වූ පාඩුව නොසලකා හැරිය හැකිය.

(iv) පළාත් පාලන සේවයට ඇතුළුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා "නව ප්‍රවේශක නිලධාරීහු" සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙති.

**සටහන.**—මේ කරුණ සම්බන්ධයෙන් "නව ප්‍රවේශක නිලධාරී" යන පදයෙන් අදහස් කරන්නේ 1960 ජනවාරි 29 වැනි දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරනු ලබන දැන්වීම්වලට අනුකූලව පළාත් පාලන සේවා තනතුරුවලට පත්කර ගනු ලබන නිලධාරීන් ය.

5. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකු විසින් ම, තමා ලාංකිකයකු බවට සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතු ය. පළාත් පාලන සේවයට බඳවා ගැනීම් සම්බන්ධ සියලුම කටයුතු සඳහා "ලාංකික" යන වචනයෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

6. **යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම ආකාරයකින් ම සුදුසුකම් ලැබ සිටින මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූ අයට ද, සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිට සිය කැමැත්තෙන්ම සේවයෙන් අස්වූවන් හැර සෑම කෙනෙකුටම ද, ඔව්හු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස, නො කඩවා සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දිනත්, ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයේ යෙදී සිටි කාල පරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

7. **වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකා ම අයදුම්පත් එවීමට පළාත් පාලන සේවා සාමාජිකයන්ට පුළුවන.

8. ප්‍රසිද්ධ කොට ඇති තනතුරෙහි පන්තියට හා ශ්‍රේණියට ම අයත් වන තනතුරු උසුලන පළාත් පාලන සේවා සාමාජිකයන්ට අධ්‍යාපන සුදුසුකම් නො තකා, පළ කොට ඇති ඇබෑර්තුවට මාරු වී යාම සඳහා අයදුම් පත් එවිය හැකි ය.

9. **වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත් තම තමන් සේවය කරන ප්‍රාදේශික බල මණ්ඩලයේ සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දැනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ගයෙනි. ආණ්ඩුවේ සේවයෙහි ස්ථිර තනතුරු දරන නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේ දී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරා ගනු ලැබුව හොත් ඔවුන් සවකීය තනතුරු වලින් මුදාහරින්ට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කළ යුතු යි.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයන් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iv) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යම් නැනැත්තකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම් පතෙහි යම් කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම්, රාජකාර්යයෙන් පහ කරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැළපෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(vii) අයදුම් පත් වනාහි මීට යා කොට ඇති ආකෘතියට සාරානුකූලව පිළියෙළ කොට පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවේ) එවිය යුතුයි.

(viii) අවසාන දිනට පසු මෙම කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සලකා බලනු නො ලැබේ.

## අන්‍යාකාරයකින් සඳහන් කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම් පතේ ආකෘතිය

### පළාත් පාලන සේවය

සැ. යු.—(i) අයදුම් පත්‍ර මෙහි පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට, තනතුරට අදාළ වන ගැසට් නිවේදනයෙහි සඳහන් අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දින හෝ ඊට පළමු කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර සභාපතිගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසු බැව් නිශ්චය කරගනු පිණිස, තම අයදුම් පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැලකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදාළ සියළුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලා ගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ සවකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) උප්පැන්න සහතිකය, (2) ඉංග්‍රීසි/සිංහල/දෙමළ යන භාෂාවලින් සමත් වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (3) චරිත සහතිකය, (4) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදාළ වේ නම් වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතික.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 9 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැලකිල්ල යොමු කරන්න.

———— තනතුරු සඳහා වූ අයදුම් පතයි (——)

1. පුරප්පාඩුව ප්‍රසිද්ධ කොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
2. සම්පූර්ණ නම පැහැදිලි අකුරින් :————.

ජාතිය :————.

(ඔබ ලියාපදිංචි වීමෙන් ලාංකිකයකු වී නම් පුරවැසි භාවය පිළිබඳ සහතිකයේ දිනයත් සැඳහුම් අංකයත් සඳහන් කරන්න).

3. තැපැල් ලිපිනය :————.

(ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි).

4. (අ) අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට නියම වයස : අවුරුදු————, මාස————, දින————.

(ආ) උපන් දිනය :—

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය—

(අ) අයදුම්කරු :————.
(ආ) අයදුම්කරුගේ පියා :————.
(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.

(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) හෝ පිරවිය යුතුයි).

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :————.

| සාමාන්‍ය අධ්‍යාපනය | | | වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය | | |
|---|---|---|---|---|---|
| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා | විද්‍යායතනය | සිට | දක්වා |
| 1. | | | 1. | | |
| 2. | | | 2. | | |
| 3. | | | 3. | | |
| 4. | | | 4. | | |
| 5. | | | 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග—

(අ) සිංහල :————.
(ආ) ඉංග්‍රීසි :————.
(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ/හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්ෂා (පත්වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන (තනතුරු, පළාත් පාලනායතන හා කාලසීමාවන්) : ————.

(ඈ) දැනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.
(ii) දීමනා හැර දැනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය : ————.
(iii) විශ්‍රාම වැටුප් සහිත ද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—

සේනාංකය, තරාතිරම, සේවයට බැඳුණ දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම හා භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද ? :————.

(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.

13. **විශේෂ සුදුසුකම්.**—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශෙෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේ ද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැදීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශෙෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————. (ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ).

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය

### පළාත් පාලන සේවයට අයත් ශුද්ධ කරන්නෙකුගේ තනතුර

පළාත් පාලන සේවයට අයත් ශුද්ධ කරන්නෙකුගේ තනතුරක් සඳහා තිස්සමහාරාම ගම්කාර්ය සභාවේ සභාපතිවරයා ඉල්ලුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලැබූ අයදුම්කරු පළමුවරට තිස්සමහාරාම ගම් කාර්ය සභාවට පත් කරනු ලැබෙයි.

2. වාර්ෂික වැටුප් ක්‍රමය.—රු. 504—20 × 12—රු. 744. රු. 648 ට පෙර කාර්යක්ෂමතා කඩඉම.

3. අවශ්‍ය සුදුසුකම් :—

(අ) වයස.—1960 ජූලි 9 වැනි දිනට වයස අවුරුදු 20 ට නොඅඩු 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) ඉල්ලුම්කරුවන්ට සිංහල හෝ දෙමළ ලියන්ට හා කියවන්ට හැකි විය යුතු අතර, ඩීසල් ඇන්ජින් වලින් ක්‍රියා කරවන "ඕල්ටනේටර් සෙට්", විදුලි බල මධ්‍යස්ථාන උපකාරක කොටස් සහ ස්විච් ගියර් ක්‍රියා කරවීමට හා නඩත්තු කර වීමට හැකි විය යුතුයි. කලින් පළපුරුද්ද අතිරේක සුදුසු කමක් වෙනවා ඇත.

4. අනිකුත් සුදුසුකම් ඇත්නම්, පළාත් පාලන සේවා සාමාජිකයන් ගේ සහ පළාත් පාලනායතනවල කම්කි කම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ හතර වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවා තනතුරුවලට පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර, පත්වීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි යටතේ සඳහන් කොට ඇති ආකෘති පත්‍රයෙහි සාරානු කූලව පිළියෙල කොට 1960 ජූලි මස 9 වැනි දිනට හෝ ඊට පළමු තිස්සමහාරාම ගම්කාර්ය සභාවේ සභාපතිවරයාට ලැබෙන්නට එවිය යුතුයි.

ඊ. සී. සේනානායක,
සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
තිස්සමහාරාම,
1960 ජූනි 16.

---

## විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### පළාත් පාලන සේවයේ පහළ ශ්‍රේණියට අයත් සිංහල ලඝුලේඛකයන් බඳවා ගැනීමේ විභාගය—1959 සැප්තැම්බර් 19

පළාත් පාලන සේවයේ පහළ ශ්‍රේණියට අයත් සිංහල ලඝු ලේඛකයන්ගේ සේවයේ තනතුරුවලට පත්වීම් දීම සඳහා ඉහත සඳහන් විභාගයේ ප්‍රතිඵල අනුව, පහත නම් සඳහන් අපේක්ෂකයින් පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් තෝරාගෙන ඇති බැව් මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. එදිරිසිංහ, සී. ජේ. ඇම්. (මෙනෙවිය)—කඩුගොඩ, වග.
2. කුලරත්න, වයි. ඒ. සී. (මහතා)—ජාතික මුදල් ඉතිරි කිරීමේ ව්‍යාපාරය, 23, මල්පාර, කොළඹ 7.
3. ඩයස්, බී. ඒ. ඩබ්ලිව්. (මහතා)—රජයේ වැඩ අමාත්‍යාංශය, තැ. පෙ. 1436, කොළඹ.
4. පිලෝමිනා, ඇස්. සී. (මෙනෙවිය)—පහළ හන්වැල්ල, හන්වැල්ල.
5. පෙරේරා, කේ. වී. සී. (මෙනෙවිය)—"කාන්ති", කුඩහකපොල දකුණ, ජාඇල.
6. යසවතී, ඒ. සී. (මෙනෙවිය)—පොල්හේන, මඩපාත.
7. රොසලින්, ජී. සී. (මෙනෙවිය)—පනාගොඩ, හෝමගම.
8. විනි, ඇන්. පී. (මහතා)—තැපැල් පෝර්ම ගබඩාව, පිටකොටුව, කොළඹ 11.
9. විමලාවතී, ඇර්. ඒ. (මෙනෙවිය)—බැලුම්මහර, මුදුන්ගොඩ.
10. සුමනාවතී, අයි. ඒ. (මෙනෙවිය)—නො. 2, පැරකුම් මාවත, මිනුවම්පිටිය, පානදුර.
11. සොමිනෝනා, සී. ඇම්. සී. (මෙනෙවිය)—පනාගොඩ, මැදමංඩිය, හෝමගම.

2. අපේක්ෂකයින්ට වහාම පත්වීම් දීමට පළාත් පාලන සේවා කොමිෂන් සභාව භාරගනු නොලැබේ. පළාත් පාලන සේවයේ ඇබෑර්තු ඇතිවන පරිදි ඔවුන්ට පත්වීම් දෙනු ලැබේ.

අණපරිදි,
ඩබ්ලිව්. ඒ. විජේසිංහ,
පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ජූනි 14 වැනිදා,
තැ. පෙ. 530,
කොළඹ.

---

## අතුරු ව්‍යවස්ථා

L.G.D. CE 14/21.

### ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපණතේ (198 වැනි පරිච්ඡේදයේ) 49 වෙනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ ආඩිඅම්බලම ගම්ප්‍රදේශයේ ගම් කාර්යසභාව විසින් සම්පාදිතව 1947 සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරණ ගැසට් අතිරේකයේ පළවූ ප්‍රකාශනයෙන් සංශෝධිතවූ එකී වගන්තියෙන් පළාත්පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍යතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමතකරනලද අතුරු ව්‍යවස්ථා.

වී. සී. ජයසූරිය,
පළාත්පාලන හා නිවාස කටයුතු පිළිබඳ
අමාත්‍ය කාර්යාංශයේ ස්ථාවර ලේකම්තැන.

1960 ජූනි මස 15 දින
කොළඹදීය.

### රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

#### අතුරු ව්‍යවස්ථා

1. (1) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ අයකරනු ලබන රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් ඒ බද්දට යටත්වූ යම් රථවාහනයක් හෝ සතෙක් අයිතිව හෝ භාරව හෝ පාලනයෙහි තබාගෙන හෝ සිටින්නාවූ සෑම අයෙකු විසින්ම සාමාන්‍යයෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛනයක් ප්‍රධානතුමාට සැපයිය යුතුයි. මේ ෆෝර්ම ගම්කාර්ය සභා කාර්යාලයෙන් ලබා ගත හැකිය.

(2) ආඥාපණතේ 47 වැනි වගන්තිය යටතේ බද්දගෙවීමට බැඳී සිටින අය විසින් 1960 වැනි වර්ෂය වෙනුවෙන් (1) වැනි ඡේදයේ සඳහන් උපලේඛනය සම්පූර්ණකොට 1960 වේ ජූලි මස 31 වෙනි දින හෝ ඊට මත්තෙන් හෝ ප්‍රධානතුමා වෙත යැවිය යුතුයි. එකී අය විසින් ඒ වාහනය හෝ සතා හෝ අයිතිව හෝ භාරව හෝ පාලක යෙහි තබාගෙන සිටින්නාවූ ඊට පසු මොනම අවුරුද්දක් වෙනුවෙන් වත් එකී අයගෙන් එබඳු උපලේඛනයක් අවශ්‍ය නැත.

2. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛන සැපයුවාවූ සෑම අයෙක්ම තවදුරටත් දැනුම්දෙනු ලැබීමක් නැතිව

(අ) ඒ උපලේඛනයේ සඳහන් රථවාහන සහ සතුන් සඳහාවූ බද්ද 1960 අවුරුද්ද වෙනුවෙන් ඒ අවුරුද්දේ සැප්තැම්බර් මස 30 වෙනිදා හෝ ඊට මත්තෙන් හෝ ගෙවීමට යටත්වෙති. තවද,

(ආ) ඊටපසු එක් එක් වර්ෂය වෙනුවෙන් "ඒ" උපලේඛනයේ සඳහන් කරන ලදුව එකී වර්ෂයේ දවස් 30කට වැඩි කාලයක් තමා අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නා වූ එකී රථවාහන සහ සතුන් සඳහා වූ බද්ද එකී එක් එක් අවුරුද්දේ මාර්තු 31 වැනිදා හෝ ඊට මත්තෙන් ගෙවීමට යටත්වෙති.

3. 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය සැපයුවාට පසු යම්කිසිවකු විසින් ඒ උපලේඛනයේ සඳහන් නොකරන ලද්දාවූ ආඥාපණත යටතේ බද්දට යටත්වූද යම් රථවාහනයක් හෝ සතෙකු අත් පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චියට ගෙන තිබේනම් හෝ 1 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ යම් උපලේඛනයක් සපයා නැත්තාවූ යම්කිසිවකු විසින් එකී බද්දට යටත් යම් රථවාහනයක්

හෝ සතෙකු පළමුවන වරට අත්පත් කරගෙන, තබාගෙන හෝ පාවිච්චි යට ගෙන තිබේනම් එවිට ඒ අය විසින් එබඳු යම් රථවාහනයක් හෝ සතෙකු අත්පත් කර ගැණීමේ හෝ තබා ගැනීමට නොහොත් පාවිච්චි කිරීමට පටන් ගැනීමේ දින සිට එක මාසයක් ඇතුළතදී සාමාන්‍ය යෙන් මෙහි පහත සඳහන් "ඒ" උපලේඛයේ සඳහන් පෝර්මයේ ප්‍රකාරයට ලියවිල්ලකින් වූ දැන්වීමකින් එසේ අත්පත් කර ගත් බව ප්‍රධානතුමාට දැන්විය යුතුයි.

4. ආඥාපණතේ 47 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව 3 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයුවාවූ සෑම අයෙක් ම එකී ලේඛනය සැපයූ අවුරුද්ද වෙනුවෙන් ඊටපසු සෑම අවුරුද්දක් වෙනුවෙන් ද එකී ලේඛනයේ සඳහන් කරනු ලැබ තමාට අයිතිව හෝ තමාගේ භාරයේ හෝ තමාගේ පාලනය පිට හෝ තිබෙන්නාවූ රථවාහන හා සතුන් පිළිබඳ බද්ද ඒ සඳහා ප්‍රධාන තුමා විසින් තමාට දැනුම්දෙනු ලබන යම්කාල සීමාවක් ඇතුළතදී ගෙවීමට බැඳී සිටිති. 5 (1) 1 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උප ලේඛනය හෝ 3වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය හෝ සැපයුවාට පසු ඒ උපලේඛනයට ඇතුළත් කළාවූ හෝ උපලේඛනයේ සඳහන් කළාවූ හෝ යම්රථවාහනයක් හෝ සතෙකු සම්බන්ධයෙන් වූ බද්ද ගෙවීමට බැඳීමෙන් ආඥා පණතේ 47 (3) වැනි වගන්තිය යටතේ තමා නිදහස් කිරීමට අයිතිවාසිකම් කියා සිටින සෑම අයෙකු විසින් ම එසේ නිදහස් කිරීමට අයිතිවාසිකම් කියාසිටින්නේ අසවල් හේතු නිසායයි දක්වෙන ලියවිල්ලකින් වූ දැන්වීමක් වහාම ප්‍රධාන තුමාවෙත යැවිය යුතුයි.

(2) 1වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් උපලේඛනය හෝ 3වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් ලියවිල්ලකින් වූ ලේඛනය සැපයූවාට පසු ඒ රථවාහනය හෝ සතා තබා ගැනීමට හෝ පාවිච්චි කිරීම නතර කළාවූ නොහොත් ඒ පිළිබඳ අයිතිවාසිකම් අත්හැරියාවූ සෑම අයෙකු විසින් ම ලියවිල්ලකින් වූ දැන්වීමකින් තමා ඒ සතා හෝ රථවාහනය තබා ගැනීම හෝ පාවිච්චිකිරීම නතර කළ බව නොහොත් ඒ ගැන අයිතිවාසිකම අත්හලබැව් වහාම ප්‍රධානතුමාවෙත ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

6. (1) යම්කිසිවකු විසින් යම්කිසි රථවාහනයක් සඳහා බද්ද ගෙවූ විට ප්‍රධානතුමා විසින් ඒ බද්දගෙවූ රථවාහනය වෙනුවෙන් ඒ අයට මෙහි පහත සඳහන් "බී" උපලේඛනයෙහි සඳහන් පෝරමයේ ප්‍රකාරයට ඒ රථවාහනය සඳහා වෙන් වෙන් වශයෙන් යොදා ඇති විශෙෂ අකුරුද තහඩුව නිකුත්කරන අවුරුද්ද දක්වෙන ඉලක්කම්ද රථවාහන රිජිස්ටරයේ ඒ ඒ රථවාහන පිළිබඳ වූ අංකයද සටහන් කොට ඇති තහඩුවක් නිකුත්කළ යුතුයි.

(2) එබඳු යම් තහඩුවක් පාවිච්චිය නිසා හෝ වෙනයම් ලෙසකින් හෝ නොපැහැදිලිව නොහොත් මැකී ගොස් තිබෙතොත් ඒ තහඩුව අයිතිකාරයා විසින් ඒ ප්‍රධානතුමාට ආපසු භාරදිය යුතුයි. තවද ඔහු විසින් ශත 50ක් ගෙවූවිට ඔහුට අළුත් තහඩුවක් නැවත ලබා ගැනීමට අයිතිවාසිකම තිබේ. එබඳු යම් තහඩුවක් නැතිවී හෝ සොරාගෙන තිබෙන බව දිවුරුම් සහතිකයකින් හෝ වෙනයම් ලෙසකින් ප්‍රධාන තුමාට ඒත්තු ගැණීමට සැලස්වුවහොත් එතුමා විසින් අයිතිකාර යාගේ ඉල්ලීම පිටත් අයිතිකාරයා විසින් ශත 60ක් ගෙවන ලැබූ විටත් අළුත් තහඩුවක් නිකුත්කළ හැකිය.

7. සෑම රථවාහනයකම එම අවස්ථාවේ අයිතිකරු විසින් හෝ භාර කරු විසින් 6වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ ඒ රථවාහනය වෙනු වෙන් නිකුත්කරන ලද තහඩුව ඒ රථවාහනයේ කාටත් පෙනෙන තැනක සවිකළ යුතුයි.

8. ප්‍රධානතුමා විසින් හෝ කාර්ය සභාවේ ආදායම් ඕවර්සියර්වර යෙකු විසින් හෝ පොලිස් නිලධාරියෙකු විසින් හෝ ප්‍රධානතුමාගෙන් ලියවිල්ලකින් බලයලත් ඕනෑම නිලධාරියෙකු විසින් හෝ ඕනෑම මාවතක හෝ පාරක ගමනාගමනයේ යෙදී තිබෙන රථවාහනයක් ද ඒ රථවාහනයෙහි 7 වැනි අතුරු ව්‍යවස්ථාවේ ප්‍රකාර සවිකොට තිබිය යුතු තහඩු පරීක්ෂාකර බැලීම පිණිස නවත්වා නතර කිරීම නීත්‍යානු කූලවන්නේ ය. තවද ප්‍රධානතුමා විසින් හෝ එබඳු වෙනත් නිලධාරියා විසින් ඉල්ලීමක් කර සිටි කල්හි එකී ඕනෑම රථයක එම අවස්ථා වේදී භාරකාරයා විසින් හෝ රථය පදවන්නා විසින් හෝ රථය නවත්වා ප්‍රධානතුමාට හෝ එකී නිලධාරියාට එකී තහඩුව පරීක්ෂා කර බැලීමට ඉඩදිය යුතුයි.

9. කාර්ය සභාව විසින් සම්පාදිතව 1950හේ දෙසැම්බර මස 8 වැනි දින අංක 10,186 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද 59 සිට 65 දක්වාවූ අතුරු ව්‍යවස්ථා මෙයින් අවලංගු කරනු ලැබේ.

10. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ප්‍රධානතුමා" යනුවෙන් කාර්ය සභාවේ ප්‍රධානතුමා අදහස් කරනු ලැබේ.

"කාර්යසභාව" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ ආඩිඅම්බලම ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව අදහස් කරනු ලැබේ.

"ආඥාපණත" යනුවෙන් ගම්සභා ආඥාපණත (198 වැනි පරිච්ඡේදය) අදහස් කරනු ලැබේ.

## "ඒ" උපලේඛනය

### පෝර්මය

අංකය :————.

ඡන්ද කොට්ඨාශ අංකය :————.

**ආඩිඅම්බලම ගම්ප්‍රදේශයේ ගම්කාර්ය සභාව**

රථවාහන හා සතුන් පිළිබඳ බද්ද වෙනුවෙන් වූ අතුරුව්‍යවස්ථාවල ප්‍රකාරයට සැපයියයුතු රථවාහන හා හෝ සතුන් පිළිබඳ ලේඛනයයි.

අයිතිකාරයාගේ නාම :————.

ලිපිනය :————.

ගම :————.

| රථවාහන හා/හෝ සතුන් පිළිබඳ විස්තර | ගණන වචන වලින් | වෙනත් විස්තර |
|---|---|---|
| කරත්ත, තිරික්කල හෝ ජින්රික්ෂෝ කරත්ත හැර වෙන ඕනෑම අන්දමක වාහන ... | | |
| ඕනෑම අන්දමක ගොන්දෙන්නා බඳින බරකරත්ත හෝ තිරික්කල ... ... | | |
| තනිගොනා බඳින කරත්ත හෝ තිරික්කල ජින් රික්ෂෝ කරත්ත ... ... | | |
| අත් කරත්ත ... ... | | |
| බයිසිකල් (වෙනත් විස්තර සඳහා සපයා ඇති කොටසේ සාදන ලද අයගේ අංකය සඳහන් කරන්න.) | | |
| අලි ... ... | | |
| අශ්වයෝ ... ... | | |
| බූරුවෝ ... ... | | |

මගේ දැනීමේ හැටියට ඉහත සඳහන් විස්තර සෑම අතින්ම නිවැරදි බවටත්, සත්‍යබවටත් සහතික කරමි.

දිනය :————.

————.

අයිතිකරුගේ අත්සන.

## "බී" උපලේනය

ඕනෑම අන්දමක සෑම ගොන් දෙන්නා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ආ : බ : ක :

සෑම තනි ගොනා බඳින බරබාග කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ආ : බ : බා :

සෑම බයිසිකලයක් සඳහා ආ : බ :

---

L.G.D. GE. 14

## ගම්සභා ආඥාපනත

ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 49 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ මහර ගම්ප්‍රදේශයේ ගම්කායෂී සභාව විසින් සම්පාදිතව 1947තේ සැප්තැම්බර් මස 24 වෙනි දින අංක 9,773 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළවූ ප්‍රකාශනයෙන් මඳක් වෙනස් කරනලද එකී වගන්තියෙන් පලාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ ඇමතිතුමා කෙරෙහි පැවරී තිබෙන බලයේ ප්‍රකාර එතුමා විසින් අනුමත කරන ලද උප නීති.

වී. සී. ජයසූරිය,
පලාත් පාලන සහ නිවාස කටයුතු පිළිබඳ අමාත්‍ය කායභිංශයේ ස්ථාවර ලේකම් තැන.

1960 ජූනි මස 14 වෙනි දින,
කොළඹදීය.

## උපනීති

### ආයුර්වේද බෙහෙත් ශාලා

1. ගම්සභා ආඥාපනතේ (198 වැනි පරිච්ඡේදය) 43 (බීබී) වැනි වගන්තිය යටතේ කාර්‍ය්‍ය සභාව විසින් මහර පිහිටුවන ලද ආයුර්වේද බෙහෙත් ශාලාව කාර්‍ය්‍ය සභාව විසින්ම නඩත්තු කළ යුතුවත් හැර, 1941 කේ අංක 17 දරන ස්වදේශීය ඖෂධ පිළිබඳ ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයකු භාරයේ තැබිය යුතුද වන්නේ ය.

2. 1 වැනි උප නීතියේ සඳහන් ස්වදේශීය වෛද්‍ය වෘත්තියෙහි යෙදී සිටින්නාවූ අයකු විසින් හෝ කාර්‍ය්‍ය සභාව විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් කිසියම් නිලධාරියෙකු විසින් හෝ කාර්‍ය්‍ය සභාව විසින් නියම කරනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව සම්බන්ධයෙන්වූ ගණන් හිලවූ පිළිබඳ යම් යම් පොත් පත් හා වෙනත් එබඳු ස්ථානද කාර්‍ය්‍ය සභාව විසින් අනුමත කරනු ලබන යම් පිළිවෙළකට හා යම් විදියකට අනුව තැබිය යුතු වන්නේ ය.

3. කාර්‍ය්‍ය සභාව විසින් ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා අවශ්‍ය අරමුදල් ගම්කාර්‍ය්‍ය සභා පොදු අරමුදලෙන් අවුරුදුපතා ලබා ගෙන පරිහරනය කළ හැකි අතර එසේ පරිහරනය කිරීම සඳහා කාර්‍ය්‍ය සභාවේ වාර්ෂික අය වැය ලේඛනයෙන් හෝ වරින් වර කාර්‍ය්‍ය සභාව විසින් සම්මත කරනු ලබන අතිරේක ඇස්තිමේන්තුවලින් හෝ මුදල් වෙන් කළ යුතු ද වන්නේ ය.

4. 5 වැනි උප නීතියේ සඳහන් විධිවිධාන වලට යටත්ව ආයුර්වේද බෙහෙත් ශාලාවේ රෝගීන්ට ප්‍රතිකාර කිරීම නොමිලයේ විය යුතු වන්නේ ය.

5. ආයුර්වේද මෙහෙත් ශාලාවට සපයන ලද බෙහෙත් හා ඖෂධ වල වටිනාකමෙන් කොටසක් පියවාගැනීම සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ ප්‍රතිකාර කරන එක් එක් රෝගියාගෙන් ශත 50 බැගින්වූ ගාස්තුවක් කාර්‍ය්‍ය සභාව විසින් අයකළ යුතුය. සභාපතිතුමා විසින් හෝ ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද නිලධාරියකු විසින් හෝ කාර්‍ය්‍ය සභාව විසින් අනුමත කරන ලද ආකෘති පත්‍රයකින් රෝගියෙකු ගෙන් අයකරනු ලබන එකී සෑම ගාස්තුවක් සම්බන්ධයෙන්ම වහාම කුවිතාන්සියක් නිකුත් කළ යුතු වන්නේය. එකී සෑම කුවිතාන්සියකම කාබන් අනුපිටපතක් තිබිය යුතුවාත් හැර ඒවායේ පිළිවෙළින් අංක යොදා තිබිය යුතුද වන්නේ ය.

6. සභාපති තුමා විසින් ස්වකීය අභිමතය අනුව දුප්පත්කම නිසා 5 වැනි උපනීතියේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් ඕනෑම රෝගියෙකු නිදහස් කළ හැකි වන්නේ ය.

7. ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව සඳහා හිතවතුන්ගෙන් ලැබෙන යම් යම් පරිත්‍යාග මුදල් එකී බෙහෙත් ශාලාවේ විය හියදම් පියවා ගැනීම පිණිස ප්‍රයෝජනය ගතයුතු වන්නේ ය.

8. සභාපතිතුමා විසින් දෙසැම්බර මාසයේ 31 වැනිදායින් අන්තිම වන එක් එක් අවුරුද්ද අවසානයේදී ඒ ඒ අවුරුද්ද සඳහා ආයුර්වේද බෙහෙත් ශාලාවේ නඩත්තුව පිණිස ලැබෙන මුදල් හා ඒ සම්බන්ධයෙන් විය පැහැදම් වන මුදල් ද පෙන්නුම් කරන සටහනක් සම්පාදනය කිරීමට සැලැස්විය යුතු වන්නේ ය.

9. මේ අතුරු ව්‍යවස්ථාවල :—

"ආයුර්වේද බෙහෙත් ශාලාව" යනුවෙන් කාර්‍ය්‍ය සභාව විසින් පිහිටුවා නඩත්තු කරගෙන යනු ලබන ආයුර්වේද බෙහෙත් ශාලාව අදහස් කරනු ලැබේ.

"සභාපතිතුමා" යනුවෙන් කාර්‍ය්‍ය සභාවේ සභාපතිතුමා අදහස් කරනු ලැබේ.

කාර්‍ය්‍ය සභාව" යනුවෙන් කොළඹ දිස්ත්‍රික්කයේ මහර ගම් ප්‍රදේශයේ ගම් කාර්‍ය්‍ය සභාව අදහස් කරනු ලැබේ

---

# අය-වැය ලෙඛන

## මොරටුව නගර සභාව

### මුදල් නීතිසංග්‍රහයේ අංක 12 (II) යටතේ කරන ඉල්ලීමයි

### අයවැය ලේඛනය—1960

පහත දක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් ශීර්ෂයේ මුදල ඒ හා සමහ දක්වෙන වැඩිපුර වියදම් යටතේ සඳහන් ශීර්ෂයෙන් වැයකොට ඒ සඳහා නගර සභා අනුමතිය 1960.3.26 දින අංක 5 දරණ යෝජනාවෙන් ලබාගන්නා ලදී.

**ඉතිරි මුදල්**

| වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|
| සී.—තානායම් හා අම්බලම්— | |
| 4. සංවර්ධන කටයුතු ... ... | 1,000 0 |
| | 1,000 0 |

**වැඩිපුර වියදම්**

| වැය ශීර්ෂ | රු. ශ. |
|---|---|
| සී.—තානායම් හා අම්බලම්— | |
| 3. ලී බඩු හා උපකරණ ... ... | 1,000 0 |
| | 1,000 0 |

එච්. ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු,
නගර සභාපති.

1960.6.14 දින
මොරටුව නගර සභා කාර්‍ය්‍යාලයේදීය

## මොරටුව නරග සභාව

### අතිරේක අයවැය ලේඛන අංක 2—1960

| වැය ශීර්ෂ | රු. ශ. | |
|---|---|---|
| ඊ. 7—වෙළඳපොළවල් හා ගාල්— | | |
| බී. නඩත්තු කිරීම ... | 910 64 | —1960.5.14 දින යෝජනා අංක 23 |
| ඊ. 1—මහජන සනීපාරක්ෂාව— | | |
| අයි. සෞඛ්‍ය සතිය සඳහා වියදම | 100 0 | —1960.5.18 දින යෝජනා අංක 13 |
| | 1,010 64 | |

එච්. ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු,
නගර සභාපති.

1960.6.14 දින,
මොරටුව නගර සභා කාර්‍ය්‍යාලයේදීය.

---

# විවිධ දැන්වීම්

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්කාර්‍ය සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලෙඛනයේ සඳහන් අය විසින් මස් විකිණීම පිණිස 1960 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත් මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර ගම්කාර්‍ය සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ සඳහායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සිටින සේ මෙම දැන්වීම "ගැසට් පත්‍රයේ" පලවන දින සිට 14 දිනක් ඇතුළත මාවෙත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ 201 වැනි පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥාපනතින් සංශෝධනවූ අංක 6 දරණ ආඥාපනත යටතේ දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුකරුගේ නම සහ ලිපිනය | ස්ථානය හා වෙළඳාම |
|---|---|
| 1. ඇම්. සී. ආම්. මීරාසායිබු, මල්ලවපිටිය | පොතුහැර සහ පිදුරුවැල්ල යන කඩමණ්ඩිවල හරක්මස් වෙළඳාම සඳහා කඩනබාගැනීම |
| 2. ඇස්. ඒ. රසාක්, මල්ලවපිටිය | පොතුහැර සහ පිදුරුවැල්ල කඩමණ්ඩිවල හරක්මස් වෙළඳාම සඳහා කඩනබාගැනීම |
| 3. ආර්. විලියම්සිංඤො, කුරුණෑගල | හරක්මස් සහ එළුමස් වෙළඳාම සඳහා පොතුහැර කඩමණ්ඩියේ කඩයක් තබාගැනීම. |

ඩී. කළුහෙන්දිවල,
පොතුහැර ගම්කාර්‍ය සභාවේ ප්‍රධානතැන.

ගම්කාර්‍ය්‍යා සභා කාර්‍ය්‍යාලය,
මහපිටිය—පොතුහැර 18.6.60.

## උඩපනෝ කෝරළේ ගම්ප්‍රදේශයේ ගම්කාරක සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනත

### 201 වන පරිච්ඡේදය

මෙහි පහත විස්තර දැක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් මස් පිණිස සතුන් මරා විකිණීම සඳහා 1960 වර්ෂයට බලපත්‍ර ඉල්ලුම් කොට ඇති බවත්, මෙම බලපත්‍ර නිකුත් කිරීමට විරුද්ධවන උඩපනෝ කෝරළේ ගම්ප්‍රදේශයේ තුළ පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධවන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ වෙන දින සිට දහ හතර දිනක් ඇතුළත මා වෙත ලියා එවිය හැකි බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥපනතේ 201 වන පරිච්ඡේදයේ අංක 7 දරණ 1947 අංක 44 දරණ ආඥපනතින් සංශෝධිතවූ අඩක 6 දරණ ආඥපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

කේ. ඇම්. අප්පුහාමි,
උඩපනෝ ගම්කායක සභාවේ සභාපති නැත.

ගම්සභා කාර්යාලය,
උඩපනෝ,
පූන්ඩලුඔය,
1960 ජූනි මස 18.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | ස්ථානය | | බලපත්‍රයේ ස්වභාව |
|---|---|---|---|---|
| ටී. ඇස්. සෙයියදු අහමඩ් | ... | පූන්ඩලුඔය | ... | හරක් මස් |
| ඇස්. මොහමඩ් යූසුප් | ... | පූන්ඩලුඔය | ... | හරක් මස් |
| ඇස්. ඇස්. වී. මොහමඩ් සීනි | ... | පූන්ඩලුඔය | ... | හරක් මස් |
| ඇස්. ඇස්. වී. මොහමඩ් සීනි | ... | පූන්ඩලුඔය | ... | එළුමස් |
| ජී. ඇස්. මොහොමඩ් හනීෆා | ... | පූන්ඩලුඔය | ... | එළුමස් |
| එච්. පාගුස් | ... | පූන්ඩලුඔය | ... | හරක් මස් |
| ඒ. අබ්බාස් | ... | පූන්ඩලුඔය | ... | හරක් මස් |

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.